# මැතිවරණ කොමිෂන් සභාවේ පුරප්පාඩු

**1.** අතිරේක මැතිවරණ කොමසාරිස් (පුරප්පාඩු සංඛ්‍යාව 03)
රාජගිරිය මැතිවරණ කොමිෂන් සභා මහ ලේකම් කාර්යාලය

අවශ්‍ය සුදුසුකම්

i. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු වීම.
ii. මැතිවරණ සංවිධාන කටයුතු හා මැතිවරණ නීති පිළිබඳව අවබෝධයක් තිබීම අත්‍යාවශ්‍ය වන අතර, මැතිවරණ දෙපාර්තමේන්තුවේ/ කොමිෂන් සභාවේ සේවය කර තිබීම හෝ මැතිවරණ කටයුතු වලදී මැතිවරණ කාර්යාලයක මූලික රාජකාරී ඉටු කර තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.
iii. ස්වකීය මව් භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාව භාවිත කරමින් රාජකාරි කටයුතු කිරීමේ හැකියාව
iv. මව් බසට අමතරව අනෙක් රාජ්‍ය භාෂා පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් වේ.
v. දේශපාලන කටයුතුවලට සම්බන්ධ නොවී සිටීම අනිවාර්ය වේ.

**2.** නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් - (පුරප්පාඩු සංඛ්‍යාව 04)
**පුරප්පාඩු පවතින්නේ කොළඹින් බැහැර දිස්ත්‍රික් කාර්යාලවලය.**

අවශ්‍ය සුදුසුකම්

i. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරියකු වීම.
ii. මැතිවරණ සංවිධාන කටයුතු හා මැතිවරණ නීති පිළිබඳව අවබෝධයක් තිබීම අත්‍යාවශ්‍ය වන අතර, මැතිවරණ දෙපාර්තමේන්තුවේ/ කොමිෂන් සභාවේ සේවය කර තිබීම හෝ මැතිවරණ කටයුතු වලදී මැතිවරණ කාර්යාලයක මූලික රාජකාරී ඉටු කර තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.
iii. පත්වීමට අදාළ ප්‍රදේශයේ භාවිතාවන රාජ්‍ය භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාව භාවිත කරමින් රාජකාරි කටයුතු කිරීමේ හැකියාව
iv. දේශපාලන කටයුතුවලට සම්බන්ධ නොවී සිටීම අනිවාර්ය වේ.
v. මව් බසට අමතරව රාජ්‍ය භාෂා පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් වේ.

**3.** අධ්‍යක්ෂ (සැලසුම් හා පර්යේෂණ) - පුරප්පාඩු සංඛ්‍යාව - 01

අවශ්‍ය සුදුසුකම්

(I). ශ්‍රී ලංකා සැලසුම් සේවයේ 1 පන්තියේ නිලධාරියෙකු වීම.
(II). ස්වකීය මව්බස හා ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණත්වය හා මව්බස සිංහල නොවේ නම් සිංහල මාධ්‍යයෙන් කටයුතු කිරීමේ හැකියාව අත්‍යාවශ්‍ය වේ.
(III). මැතිවරණ දෙපාර්තමේන්තුවේ/ කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව අත්දැකීම් හා මැතිවරණ සංවිධාන කටයුතු පිළිබඳ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සැලකේ.
(IV). දේශපාලන කටයුතුවලට සම්බන්ධ නොවී සිටීම අනිවාර්ය වේ.

**4. අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය) - පුරප්පාඩු සංඛ්‍යාව 01**
**රාජගිරිය මැතිවරණ කොමිෂන් සභා මහ ලේකම් කාර්යාලය**

**අවශ්‍ය සුදුසුකම්**

i. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ නිලධාරියෙකු වීම.
ii. ස්වකීය මව්බස හා ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණත්වය හා මව්බස සිංහල නොවේ නම් සිංහල මාධ්‍යයෙන් කටයුතු කිරීමේ හැකියාව අත්‍යවශ්‍ය වේ.
iii. මැතිවරණ දෙපාර්තමේන්තුවේ/ කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව අත්දැකීම් හා මැතිවරණ සංවිධාන කටයුතු පිළිබඳ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සැලකේ.
iv. දේශපාලන කටයුතුවලට සම්බන්ධ නොවී සිටීම අනිවාර්ය වේ.

**5. පරිපාලන නිලධාරී (පුරප්පාඩු සංඛ්‍යාව 04) - රාජගිරිය, කොළඹ, වවුනියාව, මහනුවර**

**අවශ්‍ය සුදුසුකම්**

i. රාජ්‍ය කළමනාකරණ සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරියකු වීම.
ii. සිංහල/ දෙමළ හා ඉංග්‍රීසි භාෂා දැනුම - අදාළ පුරප්පාඩු සහිත ප්‍රදේශයේ භාවිතා වන රාජ්‍ය භාෂාව පිළිබඳ දැනුම අත්‍යාවශ්‍ය වේ.
iii. මැතිවරණ දෙපාර්තමේන්තුවේ/ කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ දැනුම
iv. දේශපාලන කටයුතුවලට සම්බන්ධ නොවී සිටීම අනිවාර්ය වේ.

**6. සිංහල/ දෙමළ භාෂා පරිවර්තක (පුරප්පාඩු සංඛ්‍යාව 02) - මැතිවරණ මහ ලේකම් කාර්යාලය හා කොළඹ**

**අවශ්‍ය සුදුසුකම්**

i. භාෂා පරිවර්තක සේවයේ නිලධාරියෙකු වීම.
ii. සිංහල/දෙමළ හා දෙමළ/සිංහල භාෂාවන්ට පරිවර්තනය කළ හැකි වීම.
iii. දේශපාලන කටයුතුවලට සම්බන්ධ නොවී සිටීම අනිවාර්ය වේ.

මෙම තනතුරු සඳහා අයදුම් කිරීමට බලාපොරොත්තු වන සුදුසුකම් සහිත නිලධාරීන් තමන් විසින් සකස් කර ගන්නා ලද අයදුම්පත්‍රයක් හා ජීව දත්ත පත්‍රිකාව, සේවයේ නියුතු දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිතව මැතිවරණ කොමිෂන් සභාවේ නිල විද්‍යුත් තැපැල් ලිපිනයට ( info@elections.gov.lk ) හෝ මැතිවරණ අධ්‍යක්ෂ ජනරාල්/ ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කරන්න.

**ලේකම්**
මැතිවරණ කොමිෂන් සභාව